# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

## ඇබෑර්තු

## අරක්කැමි තනතුර

**ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවේ**

**සුදුසුකම්** : 1. අ.පො.ස. (සා/ පෙළ) විභාගය දෙවරකදී සිංහල/ දෙමළ සහ ගණිතය ඇතුලුව විෂයන් හයක් (06) සමත්වී තිබීම.

2. පිළිගත් හෝටල් පාසලකින් ආහාර සැකසීම පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

3. පිළිගත් සංචාරක හෝටලයක පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමකි.

**වයස** : වයස අවුරුදු 50 ට අඩු විය යුතුය.

**හෝ**

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් කේතය** : PL-2, III ශ්‍රේණිය

**වැටුප් පරිමාණය** : රු. 34,090 – 10X365 – රු. 37,740/= මාසිකව

**රැකියා නියුක්තියේ කොන්දේසි** : 1. ස්ථිර අර්ථසාධක අරමුදල් පදනම මත

2. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

3. ඉහත වැටුප් පරිමාණයේ 04 වන වැටුප් තලයට ළඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. වයස අවුරුදු 50 ට අඩු අයදුම්කරුවන් නොමැති අවස්ථාවකදී වයස අවුරුදු 50 සිට 59 දක්වා අයවලුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සලකා බැලේ.

රාජ්‍ය සේවයේ තනතුරු හොබවන අයදුම්කරුවන් තමන් සේවයේ නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, පිටපතක් සෘජුව යොමු කළ යුතුය. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මුදාහැරිය හැකි බවට ආයතන ප්‍රධානීගේ සහතිකයක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

පත්වීම කරනු ලැබීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

සියලුම ජීවදත්ත සහිත අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සමග 2025.02.03 දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත යොමු කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**